
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක්  www.budusarana.lk  email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ බිනර අව අටවක පෝ ද, 2021 සැප්තැම්බර් 29 බදාදා BUDUSARANA WEDNESDAY SEPTEMBER 29, 2021

56 කාණ්ඩය, 14 පත්‍රය, ආරම්භය 1965 - 06 - 13 , ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. පිටු 10





අනුරාධපුර ජේතවන සෑරදුන් වහන්සේ

## තෙමසක් පුරා දහම් පද දෙකකින් අනුමෙවෙනි බණ දෙසූ

# මලියදේව මහ රහතන් වහන්සේ

**පැවිදි දිවියෙහි ග්‍රන්ථ ධුරය සහ විදර්ශනා ධුරය නමින් ධුර දෙකක් වෙයි. මෙයින් ග්‍රන්ථ ධුරය මහලු වයසට පත් නොවූ පැවිදි පිරිස් විසිනුත්, විදර්ශනා ධුරය මහලු වයසට පත් වූ අය විසිනුත් බහුල වශයෙන් පූරණය කරනු ලබයි. මලියදේව මහ රහතන් වහන්සේ පැවිදි බව ලැබුවේ ග්‍රන්ථ ධූරය දැරීමට සුදුසු වයසක දී ය.**



එ බැවින් ග්‍රන්ථ ධූරය පිරිය යුතු විය. මණ්ඩලාරාමය නම් විද්‍යාස්ථානයක් එකල හෙළදිව ප්‍රසිද්ධ වී තිබිණි. උන්වහන්සේ එම විද්‍යාස්ථානයට ඇතුළත් වී ධර්මය අධ්‍යයනය කර තිබේ. ධර්ම අධ්‍යයනයට පිවිසි තෙරුන් වහන්සේට පසුදින සිට ම පිණ්ඩපාතයෙන්දිවි ගෙවීමට සිදු විය. පසු දා උදෑසන උන්වහන්සේ කල්ලක නම් ගමට වැඩම කළහ. එක් උපාසිකාවක් උන්වහන්සේට දානය පිළිගැන්වී ය. ඉන් පසුව

"ස්වාමිනි, ඔබ වහන්සේ කවර ගමක වාසය කරන සේක් ද?" යි? විමසා සිටියා ය.

"උපාසිකාවනි, මම මණ්ඩලාරාම විහාරයෙහි ග්‍රන්ථධූර පුරමි"

තෙරුන් වහන්සේ පැවසූහ. එවිට උපාසිකාව

"ස්වාමිනි, එසේ නම් ඔබ වහන්සේ ගේ ඉගෙනීම අවසන් වන තෙක් මා ගේ නිවෙසින් පිණ්ඩපාතය ගෙන වළඳන සේක්වා"යි ආරාධනා කළා ය.තෙරුන් වහන්සේ ත් ඇය ගේ ආරාධනාව පිළිගත්හ. තුන් මසක් ම එම නිවෙසින් පිණ්ඩපාතය පිළිගත්හ.දිනය අවසානයේ උපාසිකාවට පුණ්‍යානුමෝදනා කළහ. එහි සුවිශේෂ ත්වයක් විය. උන්වහන්සේ තුන්මසක් ම අනුමෙවෙනි බණ ලෙස උපාසිකාවට දේශනා කොට වදාළේ, 'සුවපත් වේවා, දුකින් මිදේවා" යනදහම් පද දෙපදය පමණි. අංගුත්තර නිකායට්ඨකථාවේ මේ බව සඳහන් වෙයි. තුන් මසක් ඉක්ම ගියේ ය. දිනක් උපාසිකාවට ගම් වැසියන් ගෙන් සුබ ආරංචියක් ලැබුණි.

"උපාසිකාවනි, ඔබ ගේ බුද්ධ පුත්‍රයන් වහන්සේ ඔබට දහම් පද දෙකකින් පමණක් මාස තුනක් ම සැලකූහ. වෙනත් කිසිදු බණ පදයක් දේශනා නො කළහ. ඔබ ගේ ඒ මලියදේව තෙරුන් වහන්සේ අද රාත්‍රිය පුරා ධර්ම දේශනා පවත්වති"

යැයි පවසා ධර්මය ශ්‍රවණය කිරීමට පැමිණෙන්න යැයි දැන්වී ය. ඒ ඇසූ උපාසිකාව මෙසේ සිතුවා ය.

උන්වහන්සේ තුන් මසක් පුරාවට දහම් පද දෙකකින් පමණක් දම් දෙසූහ උන්වහන්සේ ගේ ධර්ම දේශනා හැකියාව අද දැන ගනිමි. එසේ සිතා දම් සභාවට ගොස් හිඳගත්තා ය. තෙරුන් වහන්සේ ධර්මාසනයට වැඩම කළහ.

"තුන්මසක් මුලුල්ලේ 'සුවපත් වේවා, දුකින් මිදේවා" යන දෙපදය පමණක් දේශනා කළෙමි. අද රාත්‍රි මුළුල්ලේ තුන් පිටකය ම සම්මර්ශනය කොට එ දෙ පදයෙහි අර්ථ ව්‍යාඛ්‍යාන කරන්නෙමි" පවසා ධර්ම දේශනාව ආරම්භ කළහ. තෙරුන් වහන්සේ රාත්‍රිය ගෙවා පහන් වනතුරු ම අදාළ දහම් පද දෙකෙහි අර්ථය විමර්ශනය කරමින් ධර්ම දේශනාව සිදු කළහ. දේශනාව කෙළවර උපාසිකාව සෝවාන් ඵලයට පත් වූවා ය.

අධික මතක ශක්තියක් සහිත ව ධර්මය විමසුම් නුවණින් දේශනා කිරීමේ හැකියාවක් මලියදේව තෙරුන් වහන්සේ සතු වූ බව මෙයින් පෙනේ. ධර්ම දේශනා කිරීම සෑම භික්ෂුවක් වෙතින් ම සිදු වන්නකි. එහෙත් එක ම දේශනාව කවර ස්ථානයක පැවැත්තුව ද එක ම අයුරින් පිරිස් රහත් ඵලයෙහි පිහිටීම ඉතා විශේෂ ලක්ෂණයකි. මෙය මූලික කර ගෙන මලියදේව මහ රහතන් වහන්සේ ප්‍රසිද්ධියක් ලබා තිබේ. මෙයට මුල් වී තිබෙන්නේ මජ්ඣිම නිකායේ ඡඡක්ක සූත්‍ර දේශනාව යි. බුදුන් වහන්සේ මේ සූත්‍රය දේශනා කරන විට භික්ෂූන් වහන්සේ හැටනමක් රහත් වූ බවත්, අනතුරු ව සැරියුත්, මුගලන්,

**"උපාසිකාවනි, ඔබ ගේ බුද්ධ පුත්‍රයන් වහන්සේ ඔබට දහම් පද දෙකකින් පමණක් මාස තුනක් ම සැලකූහ. වෙනත් කිසිදු බණ පදයක් දේශනා නො කළහ. ඔබ ගේ ඒ මලියදේව තෙරුන් වහන්සේ අද රාත්‍රිය පුරා ධර්ම දේශනා පවත්වති."**

මහාකාශ්‍යප ආදි ලෙසින් අසූ මහ ශ්‍රාවකයන් වහන්සේ ද මෙම සූත්‍රය දේශනා කරන කල්හි හැටනම බැගින් රහත් වූ බවත්, බුදුන් වහන්සේ පිරිනිවි කල්හි ලක්දිව මලියදේව නම් තෙර නමක් ස්ථාන හැටක සිට හැටනම බැගින් රහත්ඵලයට පත් කළ බවත් ධර්මප්‍රදීපිකාව සහ අංගුත්තර අටුවාව සඳහන් කරයි. මලියදේව මහ රහතන් වහන්සේ හෙළදිව අවසන් මහ රහතන් වහන්සේ ලෙසින් සැලකීම සාවද්‍ය කරුණකි.

උන්වහන්සේ ධර්ම දේශනාවලට විශේෂ හැකියාවක් දැක් වූ නිසා ප්‍රසිද්ධියට පත් වූ තෙර නමකි. මෙය තහවුරු කෙරෙන අවස්ථාවක් ලෙස මණ්ඩලාරාමයෙ හි දී උපාසිකාවක් අරභයා දේශනා කළ ධර්ම දේශනාවෙන් ද, සිතුල්පව්වට වැඩම කළ අවස්ථාවක හැට වයස් පිරි හැට නමකට ධර්ම දේශනා පවත්වා රහත් ඵලයට පත් කළ පුවතින් ද තහවුරු වෙයි. අංගුත්තර නිකාය අටුවාව සහ ධර්මප්‍රදීපිකාව මලියදේව මහ රහතන් වහන්සේ ධර්ම දේශනා කළ ස්ථාන සමූහයක් දක්වයි. ලෝවාමහාප්‍රාසාදය, මහා මණ්ඩපය, මහ වෙහෙර, චේතිය පර්වතය, සාකියවංශ විහාරය, කුටාලි විහාරය, වාතක පර්වතය, දීඝවාපිය, ලෝකන්දරගාමෙණ්ඩවාලය, සිතුල්පව්ව, තිස්සමහා විහාරය කැලණි මහා විහාරය, නාග මහ වෙහෙර, කලකච්ඡ ග්‍රාමය, මහවිහාරයේ යට ප්‍රාසාදය, මහ වෙහෙරෙහි මතු ප්‍රාසාදය යනු එයින් කිහිපයකි. මෙයින් පෙනෙන්නේ මලියදේව මහ රහතන් වහන්සේ ලක්දිව සිවු දෙසෙහි ම ධර්ම දේශනා පැවැත් වූ බවයි. තව ද සංචාරක දිවියක් ගත කළ හෙයින් අතීත වැසියන් මේ තෙරුන් වහන්සේ හොඳින් දැන හඳුනාගත් බවත්, ඒ නිසා අතීතයෙහි සිට මේ කීර්තිය මුඛ පරම්පරාගත ව පැමිණි බවත් විශ්වාස කළ හැකි ය.



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනයේ
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

# ඊළඟ බවය ගැන කියන
# මරණාසන්න මොහොතේ ගති නිමිති



කොළඹ මහානාම විද්‍යාලයේ
ආචාර්ය
කොලොන්නාව
පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ**
**ධම්මින්ද හිමි**

**ජීවිතයේ වඩා වැදගත් ම අවස්ථාව උපත නොව මරණය යි. මන්ද යත් සසර ගමනේ දී සුගතිය, දුගතිය තීරණය කිරීම සඳහා මෙම අවස්ථාව බොහෝ සෙයින් බලපෑම් සිදු කරන බැවිනි. එහෙයින් එම මොහොතේ දී සිත සකස් කර ගැනීම අත්‍යවශ්‍ය වේ. සිත සැකසීමේ දී එය ඒ මොහොතේ දී සිදු කර ගැනීම පහසු නොවේ. එය සිදු කරගත හැකිවන්නේ බුදු සරණ ගිය සැබෑ ශ්‍රාවකයාට පමණි.**



යහපත් ව හොඳින් සිටින කාලයේ දී පින් සිදු කරනවා සේ ම ධර්මයෙහි යෙදීම අවශ්‍යය. එමෙන් ම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලෙස හිතන්න පුරුදු කළ යුතු ය. එසේ නොමැති ව මම ඒ මොහොත් එය බලා ගන්නම්, දැන්ම අවශ්‍ය නොවේ යන හැඟීමෙන් සිටින කෙනකුට එය කළ නොහැකි ය. මරණය හමුවේ සියල්ලෝ ම බියට පත්වේ. “සබ්බේ භායන්ති මච්චුනෝ“ නිවැරැදි ව ධර්මය තේරුම් නොගත් පිරිස් ඒ මත භව සමුදය හෝ භව නිරෝධය නො ලබයි. භව යනු පැවැත්ම යි. එය ධර්මයට අනුව කම්ම භව විපාක වශයෙන් දෙයාකාර වේ.මෙහි දී කම්ම භව යනු පවතින්නට අවශ්‍ය කර්මයෝ ය . විපාක භව යනු එය විපාක වශයෙන් ලබන ස්ථානයන් ය.

එක් භවයක අවසානය මරණයෙන් කෙළවර වන අතර, අනෙක් භවයේ ආරම්භය ප්‍රතිසන්ධියෙන් සංකේතවත් වේ. සිදුහත් බෝසතාණන් වහන්සේ “අයමන්තිමාජාති නත්ථිදානි පුනබ්භවෝ“ ලෙස සිංහ නාද කොට ප්‍රීතිය ප්‍රකාශ කළේ නැවත තමන් වහන්සේ ගේ උපතක් නැති බව යි. තථාගතයන් වහන්සේ මේ භවය වර්ණනා නො කළේ මේ තත්වය නිසා ම ය. කෙනකු මේ භවයේ දී මරණයට පත්වීම දහම සඳහන් කරනුයේ “ආයුස්මාච විඤ්ඤාණං“ යනුවෙනි. එනම් ආයුෂ, උෂ්ණත්වය සහ විඤ්ඤාණය ඉවත්වීම යි. නූතන වෛද්‍ය විද්‍යාවට අනුව ඔවුන් දැක්වූයේ සිහිය, ස්වසනය, හෘද ස්පන්දනය මොළයේ විද්‍යුත් කම්පනයන් නැතිවීම වශයෙන් ය.

කෙනකුගේ උපතට හේතුවන කාරණා 03ක් මහාතණ්හාසංඛය සූත්‍රයේ දී මෙසේ දක්වනු ලැබේ. මව සුදුසු අවස්ථාවක පසුවීම , මව්පිය එක්වීමක් තිබීම හා ගන්ධබ්බයකු ගේ පැමිණීම යි. මෙහි දී ගන්ධබ්බ යනු විඤ්ඤාණය යි. ධර්මයෙහි මෙය සම්භවේසී ලෙස ද විස්තර වේ. සර්වස්තිවාදීන්ට අනුව අන්තරාභවය ලෙස ද දැක්වේ. ථේරවාදය තුළ මේ පිළිබඳ ඒකමතිකත්වයක් නොවේ. කෙනකු මිය යාමේ දී ඔහුට පහළ වන අවසාන සිතිවිලි ධාරාව චිත්ත පරම්පරාවේ අවසානය චුති සිත ලෙස විස්තර වේ. කෙනකු ගේ මිය යාමේ දී (හදිසි මරණයක් වුව ද) ඔහුට කර්ම නිමිති හා ගති නිමිති පහළ වේ. පුරුද්දක් ලෙස කරන හොඳ හෝ නරක කර්ම ආචින්ත්‍ය කර්මයන් ය. ආසන්න යනු මරණාසන්න මොහොතේ ඇතිවන සිතිවිල්ලයි.

කෝසල මල්ලිකාව, ධර්මාශෝක රජු දුගතිගාමී වන්නේ ත් (ස්වල්ප කාලයකට), වසර 50 ක් අලුගෝසු රැකියාව සිදුකළ පුද්ගලයා දිව්‍ය ලෝක ගතවන්නේ ත් මේ නිසා ම ය. එහෙත් ඒ තත්වයන් දීර්ඝ කාලයක් නොපවතී.

මෙහි වැදගත් ම අවස්ථාව ගති නිමිත්තයි. ජීවත්වන ඥාතීන් ඒ වෙනුවෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. බොහෝ වෙලාවට මරණකරුට තිබෙන ලොකුම අලාභය ධර්මය නොදත් ඥාතීන් සිටීම ය. මරණයේ දී ඒ තැනැත්තා කායික වේදනා මෙන් ම, මානසික වේදනා අත්විඳි. ඒ සියල්ලට ම වඩා ප්‍රියයන් අත්හැර යාමේ වේදනාවයි. එහි දී අවබෝධය ඇති කෙනෙක් නම් සිත කුසලයෙහි පිහිටුවා ගෙන සුගතිගාමී තැනක සිත පිහිටුවා ගනී. මෙවැනි වෙලාවක ඥාතීන් හඬන්න, වැළපෙන්න, ඇඟට පතින්න, අතපය අතගාන්න පටන් ගතහොත් ඔහු නැවත වේදනාවට මෙන් ම තෘෂ්ණාවට පත්විය හැකි ය. එහි දී සිදු කළ යුත්තේ නිදහසේ ඔහුට සිටීමට අවස්ථාව සැලසීම හා ආගමික කටයුතු සිදු කිරීමයි. පිරිත් ශ්‍රවණයට අවස්ථාව ලබාදීම, කළ පින් මතක් කිරීම, සුවඳ හඳුන්කූරු දැල්වීම, ජීව මතක වස්ත්‍රයක් පූජා කිරීම ඉතා වැදගත් ය. මරණකරුට ඊළඟ භවය පිළිබඳ ජීවත්ව සිටියදී ගතිනිමිති පහළ වේ.


> **බොහෝ වෙලාවට මරණකරුට තිබෙන ලොකුම අලාභය ධර්මය නොදත් ඥාතීන් සිටීම ය. මරණයේ දී ඒ තැනැත්තා කායික වේදනා මෙන් ම, මානසික වේදනා අත්විඳි . ඒ සියල්ලට ම වඩා ප්‍රියයන් අත්හැර යාමේ වේදනාවයි.**

අටුවාවට අනුව අපාගත වන්නේ නම්, ලෝහ කටාරම් ද, මිනිස් ලෝකයෙහි පහළ වන්නේ නම්, මව් කුසක්, තොටිල්ලක් දකින්නට ලැබේ. දිව්‍ය ආත්ම භාවයක් ලබන්නේ නම් දිව්‍ය රථ, මල්මාලා, කප්රුක් දැකීමට අවස්ථාව සැලසේ. ධම්මික උපාසකතුමන්ට මෙවැනි අවස්ථාවකට මුහුණදීමට සිදුවිය. එතුමන් ගේ අවසාන අවස්ථාවේ දී භික්ෂූන් වහන්සේ සෙත් පිරිත් දේශනා කළහ. ඒ මොහොතේ දී ධම්මික උපාසක අතින් සංඥා කළ අතර, භික්ෂූන් වහන්සේ එ තැනින් නැඟිට විහාරස්ථානයට වැඩියහ. එසේ වැඩියේ ඇයි දැයි ධම්මික උපාසකතුමන් නිවැසියන් ගෙන් විමසූ විට ඔවුන් පැවසුවේ නවත්වන්න යැයි ඔබ අතින් සංඥා කළ නිසා උන්වහන්සේ වැඩි බවයි. එහි දී එතුමා සඳහන් කළේ, මම එසේ කීවේ දිව්‍ය රථ මා කැඳවාගෙන ඒමට ආ බැවින් ඔවුන් නැවැත්වීමේ අරමුණින් බවයි. මෙය ගති නිමිත්තකි.

තව ද දිව්‍ය භවයකට යන්නේ නම් සුදු පැහැය, මිනිස් ආත්මයක් නම් කහ පැහැය, තිරිසන් භවයක් නම් නිල් පැහැය, ප්‍රේත භවයක් නම් රතු පැහැය, අසුර නම් තද කොළ පැහැය මරණකරුට දකින්නට ලැබේ.

මේ කරුණු මත මරණාස්නන මොහොත යනු අප සිතනවාට වඩා බැරෑරුම් අවස්ථාවක් බව වැටහේ. වඩා අවශ්‍ය වන්නේ අවබෝධයෙන් ඊට මුහුණදීමයි.

# අනූනව වැනි වියට සැපත්වන කුඩාහීල්ලේ පඤ්ඤාසේකර නා හිමි



මාතර ඌරුගමුවේ රත්නාවල ශ්‍රී තපෝධනාරාමාධිපති, අමරපුර සිරි සද්ධම්මවංස මහා නිකායේ මාතර හම්බන්තොට දෙදිසාවේ ප්‍රධාන අධිකරණ සංඝනායක, මහෝපාධ්‍යාය, ශාස්ත්‍රවේදී අතිපූජ්‍ය කුඩාහීල්ලේ පඤ්ඤාසේකර නාහිමි ලක්දිව සම්භාවනීය ථේරවාදී භික්ෂු පරපුරේ උදාර ගුණයන් මැනවින් ප්‍රකට කරමින් වැඩ වෙසෙන උපශාන්ත ගතිගුණයන් ගෙන් පිරිපුන් සුපේසල ශික්ෂාකාමී චිරරාත්‍රඥ මහා යතිවරයන් වහන්සේ නමකි.

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගිරුවාගම් දෙළොස් දහසට අයත් ගිරුවාපත්තුවේ බටහිර කෙළවරේ පිහිටි “කුඩාහීල්ල“ නමැති පෞරාණික සුන්දර ගම් පියසක් වෙයි. සැදැහැවත් සොඳුරු මිනිසුන් වසන එම ගම් පියසේ විසූ ප්‍රභූ පරපුරකින් පැවතෙන දෙන්දියෝනිස් රත්නායක මහෝපාසක මහතාණන් ගේ හා දෝන සිසිලියානා මහෝපාසිකා මාතාව ගේ පුත්‍ර රත්නයක් ලෙස වර්ෂ 1923 සැප්තැම්බර් මස 28 වැනි දින කුඩාහීල්ලේ පඤ්ඤාසේකර නා හිමියෝ ජන්ම ලාභය ලැබූහ. ගිහි කළ ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ බෙලිඅත්තේ පඤ්ඤානන්ද පාසලින් සහ කුඩාහීල්ල මහා විද්‍යාලයෙනි.




කුඩා කල සිට ම මහත් සැදැහැයෙන් ක්‍රියා කළ හෙයින් වර්ෂ 1936 ජූලි මස 31 වැනි දින රත්නාවල තපෝධනාරාමයේදී උතුම් වූ ප්‍රව්‍රජ්‍යා භාවයට පත් කුඩාහීල්ලේ නා හිමියන් ගේ උපාධ්‍යායන් වහන්සේ වූයේ ඌරුගමුවේ සුමනතිස්ස මාහිමි ය. ප්‍රව්‍රජ්‍යාචාර්යවරුන් වූයේ ඌරුගමුවේ පඤ්ඤාසීහ මාහිමි සහ කුඩාහීල්ලේ පඤ්ඤාරංසි මාහිමි ය. පාරිවේණික අධ්‍යාපනය ලැබීම සඳහා මුලින් ම ඇතුළත් වූයේ මාතර ශ්‍රී සුදර්ශී පරිවේණස්ථානයට යි. ඉක්බිති ව කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය මහ පිරිවෙනට ඇතුළත් වූ උන් වහන්සේ තව දුරටත් ස්වකීය ධර්ම ශාස්ත්‍ර හා ප්‍රාචීන භාෂා ඥාණය මනාව ප්‍රගුණ කර ගත්හ. එවකට එහි වැඩසිටි කුශාග්‍ර බුද්ධිමත් යතිවරයන් වහන්සේ වෙතින් ධර්ම ශාස්ත්‍රාධ්‍යයනය ලැබීමට තරම් කුඩාහීල්ලේ නා හිමියෝ භාග්‍යවන්ත වූ හ. තදනන්තර ව විද්‍යෝදය විශ්වවිද්‍යාලයට ඇතුළත් ව ශාස්ත්‍රවේදී උපාධිය ද හිමිකර ගත්හ. වර්ෂ 1945 ජූනි මස 12 වැනි දින වැලිතර මහා කප්පින වලව්ව අසල මහදූ නදියේ උදකුක්ඛේප සීමා මාලකයේදී අධිසීල සංඛ්‍යාත සුපරිසුද්ධෝපසම්පදාව ලැබූහ.

ඉක්බිති ව රජයේ පාසල් ගුරු සේවාවට එක් වූ කුඩාහීල්ලේ නාහිමි ඌරුබොක්ක මහා විද්‍යාලය, බෙරලපනාතර විද්‍යාලය, ගන්දර මහා විද්‍යාලය, ගල්පමුණ මහා විද්‍යාලය සහ දෙමටපිටිය මහා විද්‍යාලයෙහි ධර්මාචාර්යයන් වහන්සේ නමක ලෙස ක්‍රියා කළහ. එසේ ම ඌරුබොක්ක මහා විද්‍යාලයේ සහ දෙමටපිටිය මහා විද්‍යාලයේ විදුහල්පති ධුරයන් ද දැරීය. වර්ෂ 1948 ජනවාරි මස 01 වැනි දා ගුරු සේවයෙන් ඉසිඹු ලැබී ය. එයින් පසුව ද වැවුරුකන්නල විද්‍යාතුංග විද්‍යායතන පරිවෙනෙත්, දික්වැල්ල කුමාරතුංග මුනිදාස මහා විද්‍යාලයේත්, රදම්පොළ ශ්‍රී සුමංගල මධ්‍ය මහා විද්‍යාලයේත්, ධර්මාචාර්යයන් වහන්සේ නමක් ලෙස ස්වෙච්ඡාවෙන් සිදු කළ සේවාව ද බෙහෙවින් ම සම්භාවනාවට ලක්විය යුතු ය.

ඌරුගමුවේ මීගස්දෙණිය රජයේ විද්‍යාලය සහ මාතර කොටුවේගොඩ ජයසුමන පිරිවෙන ඇරඹීමෙහි ලා පුරෝගාමී වූ කුඩාහීල්ලේ නා හිමියෝ දහම් පාසල් හා පෙර පාසල් කිහිපයක් ම ඇරඹීමට ද මුල් වූ හ. එසේ ම දික්වැල්ල ප්‍රාදේශීය ශාසනාරක්ෂික මණ්ඩලයේ සභාපති ලෙස රත්නාවල ග්‍රාම සංවර්ධන සමිතියේ සභාපති ලෙස ද සමථ මූල මණ්ඩලයේ සාමාජිකත්වය ද දරමින් ප්‍රදේශයට සිදු කළේ මා හැඟි සේවාවකි.

කුඩාහීල්ලේ නා හිමි විසින් ඌරුගම් දහඅටේ ධර්ම දේශනයක් නො පවත්වන ලද විහාරස්ථානයක් නොමැති තරම් ය. ඌරුගම් දහ අට ප්‍රමුඛ වදිවයිනේ සතරදිග් භාගයේ උන් වහන්සේ පැවැත්වූ ධර්ම දේශනා ප්‍රමාණය දහස් ගණනකි. බොහෝ වයෝවෘද්ධ ව වැඩසිටිය ද කුඩාහීල්ලේ නා හිමි ගත කරනුයේ ඉතා නීරෝගී හා ක්‍රියාශීලි දිවි පෙවෙතකි. දශක තුන හතරකට පෙර ගමනා ගමන පහසුකම් හෝ මාර්ග පහසුකම් හෝ නොවූ දුෂ්කර ගම්පියසක අව්වෙහි කුඩයක් හිසලා, ඇතැම් දිනෙක පා වහන් සඟලක් වත් නොමැති ව දහදියෙන් තෙත් වූ සිරුරෙන් හා මුහුණින් යුතු ව පාසලට, දනට, පාංශුකූලයට වැඩම වූ නාහිමියන් ගේ රූපය සේ ම, රාත්‍රී කාලයෙහි හුලු අතු හා විදුලි පන්දම් එළියෙන් මහ පාරේ හා වෙල් නියර මතින් ධර්ම දේශනා සඳහා වැඩම වූ නාහිමියන් ගේ රූපය එකල ප්‍රදේශවාසී සැදැහැවත් ජනතාවට නුහුරු නුපුරුදු දසුනක් නො වී ය.

ජීවිතයේ වැඩිම කාලයක් කුඩාහීල්ලේ නාහිමිට සෙවණ දෙන්නේ ඌරුගමුවේ රත්නාවල තපෝධනාරාම ය යි. එම නිසා ම එදා මෙදාතුර ප්‍රදේශවාසී ගිහි පැවිදි සියලු ම දෙනා “රත්නාවල නායක හාමුදුරුවෝ“ යන ගෞරවණීය සේ ම ආදරණීය නාමයෙන් උන් වහන්සේ හඳුන්වති. උන්වහන්සේ ගේ අනූ නව වැනි ජන්ම දිනය නිමිත්තෙන් සැප්. 28 පෙ.ව. 9.00 ට ගැබිනි මව්වරුන්ට ත්‍යාග ප්‍රදානයක් ද රාත්‍රී 7.00 ට ආශිර්වාද පූජාව ද පැවැත්වීමට නියමිත ව තිබුණි. සැප්. 29 පෙ.ව 8.30 සිට ප.ව. 3.30 දක්වා ලේ දන්දීමේ පින්කම ද රත්නාවල තපෝධනාරාමයේදී පැවැත්වේ. තව ද දික්වැල්ල බතීගම රජයේ රෝහලේ කොරෝනා වාට්ටුවේ නේවාසික රෝගීන් වෙනුවෙන් 28 රාත්‍රී ආහාරය පිරිනැමීමට ද කටයුතු යොදා තිබුණි.

**ඌරුගමුවේ අස්සජී හිමි**

## බොදු පුවත්

**ඉබ්බාගමුව කඳුලව ඓතිහාසික මැදිරිය රජමහා විහාරස්ථානයේ පෞරාණික සංඝාවාසයේ නවීකරණ කටයුතු නිම කොට ගෙවදීම සහ කුල දරුවකු සසුන්ගත කිරීමේ පින්කම සැප්තැම්බර් මස 22 වැනි දින පෙරවරුවේ ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිළමේ ප්‍රදීප් නිලංග දැල මැතිතුමා ඇතුළු සම්භාවනීය ගිහි පැවිදි පිරිසක ගේ සහභාගීත්වයෙන්, සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූල ව පවත්වන ලදී. මහනුවර මල්වතු මහා විහාරවාසී, කඳුලව මැදිරිය රාජමහ විහාරය, ඓතිහාසික දන්තුරේ රාජමහා විහාරය ඇතුළු විහාර ගණයේ අධිපති, කර්මවාගාචාර්ය, ධර්මාචාර්ය දන්තුරේ විපස්සි නාහිමිපාණන් වහන්සේ ගේ අනුශාසනා පරිදි මෙම පින්කම සිදු කරන ලදී. නව සාමණේර හිමියන් කළු අග්ගල මේධානන්ද නමින් සසුන්ගත විය.**








# ජාතික ප්‍රතිපත්තියක් ගෙනඒම තුළින්
# බෞද්ධ උරුමය නිසි පරිදි කළමනාකරණය කර ගත හැකි යි

**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ**
**සියම් මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ**
**මිහින්තලා රජමහා විහාරාධිපති හා භාරකාර ආචාර්ය**
**වළවාහැංගුණවැවේ ධම්මරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය**



**අප රටේ බුදු දහමේ ප්‍රභවස්ථානය වූ ඓතිහාසික මිහින්තලා රජමහා විහාරස්ථානයේ වැඩසිටින ඔබ වහන්සේට සුවිශාල ශාසනික කාර්යභාරයක් පවැරී තිබෙනවා. මෙවැනි වගකීම් සහගත කාර්යභාරයක නියැළීමට ගුරු හාමුදුරුවරුන් ගෙන් ලැබුණ ආභාසය මොන වගේ ද? නායක හාමුදුරුවනේ,**

වළවාහැංගුණවැව මිහින්තලයට බොහොම සමීප ව සම්බන්ධ වුණ ගමක්. ඩවුන්දසේකර මහමුදියන්සේලාගේ පුංචිරාළ සහ ඉරුගල් බණ්ඩාරලාගේ රන්එතනා යන මගේ මව්පියන් ඉතාමත් ශ්‍රද්ධාවන්ත ගුණගරුක ආදරණීය මව්පිය දෙපළක්. මා ඇතුළු ව සහෝදර සහෝදරියන් දස දෙනකු සිටි පවුලේ බාලම දරුවා වුණ මම මද්දුම බණ්ඩා යන ගිහි නාමයෙන් හඳුන්වනු ලැබුවා. වළවාහැංගුණවැවේ ශ්‍රී රතනජෝති නායක හාමුදුරුවන් වහන්සේ සහ නාමල්වැව රතනසාර නායක හාමුදුරුවන් වහන්සේ යන දෙනම ගේ ආචාර්යත්වයෙන් 1987 වර්ෂයේ දී පැවිදි ජීවිතයට ඇතුළත් ව මහනුවර හාරිස්පත්තුව විදුමිණ විද්‍යායතන පිරිවෙනින් ශාසනික අධ්‍යාපනය ලබා ගත්තා. උසස් අධ්‍යාපනය සඳහා පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයට ඇතුළත් වෙලා ගෞරව ශාස්ත්‍රවේදී උපාධිය හැදෑරුවා. ඒ අතරතුර ඉංග්‍රීසි භාෂාව ඇතුළුව තවත් භාෂා කිහිපයක් ඉගෙන ගැනීමට කටයුතු කළා. ඒවගේ ම එංගලන්තය අමෙරිකාව, යුරෝපය ඇතුළු රටවල් 80කට වැඩි ප්‍රමාණයකට වැඩම කළා. එහිදී භාෂා දැනුම වර්ධනය කර ගන්නා ගමන් ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා සහභාගි වුණා. ඉන්දියාවේ බරණැස සංස්කෘත විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියත්, ආචාර්ය උපාධියත් ලබා ගැනීමට කටයුතු කළා. 1990 මැයි මස 14 වැනි දින උපසම්පදා පුණ්‍යකර්මය සිදුවුණ බවත් මේ අවස්ථාවේ දී ගෞරවයෙන් සිහිපත් කළ යුතු යි. ඒවගේ ම 1938 වර්ෂයේ සිට 1991 වර්ෂය දක්වා මිහින්තලා රජමහා විහාරස්ථානයේ ආධිපත්‍ය උසුලමින් වර්තමාන තත්ත්වය දක්වා පවත්වා ගෙන එනු ලැබුවේ වළවාහැංගුණවැවේ ශ්‍රී රතනජෝති නායක හාමුදුරුවන් වහන්සේ විසින් බව කෘතවේදී ව මේ අවස්ථාවේ දී සිහිපත් කළ යුතු යි.

ගුරු හාමුදුරුවන් වහන්සේ ගේ ගුරුහරුකම් හා එම යතිවර දැනුම, ඒ හඩ පෞරුෂත්වය, දේහධාරිත්වය, ඍජුපටිපන්න ගුණය වගේ ම අටලෝ දහමට කම්පා නොවී සිටීම යන සියලු දේ උන්වහන්සේ ගේ ආභාසයෙන් ලබා ගත් භික්ෂුත්වයට උරුම වූ ගුණාංගයන් තුළින් පැවිදි ජීවිතය වඩාත් ආලෝකවත් වීමට හේතු වුණ බව ගෞරව බහුමානයෙන් කෘතවේදී ව සිහිපත් කරනවා.

**ශාසනභාරධාරී ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් ඔබ වහන්සේ සිදු කළ සුවිශේෂී ශාසනික සේවය පිළිබඳ ව කෙටි සඳහනක් කරන්න හාමුදුරුවනේ,**

නායක හාමුදුරුවන් වහන්සේ ගේ අපවත්වීමත් සමග මිහින්තලා රජමහා විහාරස්ථානයේ විහාරාධිකාරී වශයෙන් මට තවදුරටත් ශාසනික සේවයෙහි නිරත වීමට සිදුවුණා. 2012 වර්ෂයේ සිට මිහින්තලා රජමහා විහාරාධිපතිත්වය හා භාරකාරත්වය උසුලමින් වර්තමානය දක්වා එම ශාසනික සේවය සිදු කරගෙන යනවා. ඒ වගේ ම අතීත, වර්තමාන, අනාගත වශයෙන් සම්බුද්ධ ශාසනය ආරම්භ වුණේත් මිහිඳු මහ රහතන් වහන්සේ වැඩම කළ මේ මහා පරම පූජනීය පින් බිමක් වුණ ඓතිහාසික මිහින්තලා විහාරස්ථානයේ දී ම යි. අතිපූජනීය දළදා වහන්සේ, ශ්‍රී මහා බෝධීන් වහන්සේ ඇතුළු අටමස්ථාන, සොළොස්මස්ථාන සියල්ලට ම ආරම්භක ස්ථානය වුණේ මිහිඳු මහ රහතන් වහන්සේ මිහින්තලයට වැඩමවීම යි.

පොසොන් මහා පින්කම රාජ්‍ය පොසොන් මහා පින්කමක් බවට පත්කිරීමට මම විශාල කැප කිරීමක් කළා. බොහෝ දේ මල් යහනාවන් උඩින් ලබා ගත් දේ නොවෙයි. බොහෝ තර්ක විතර්ක කරමින්, බොහෝ දෝෂාරෝපණයන්ට මුහුණ දෙමින් තුන් කාලයට අවශ්‍ය වන ආකාරයට ශාසනික මෙහෙවර සිදු කළා. ලංකාවේ පළමු පෙරහර වුණ මිහිඳු මහා පෙරහර රාජ්‍ය අනුග්‍රහය ඇතිව සිදු කිරීමට මේ වන විට ගැසට් කර තිබෙනවා. සීමා නිර්ණය කරමින් හරියට ම අවසන් කර නොමැති වුවත්, මිහින්තලා පූජා භූමිය ජාතික උරුමයක් බවට ප්‍රකාශයට පත්කර තිබෙනවා. වප්මස පුර අටවක පොහොය දින මිහිඳු මහ රහතන් වහන්සේ ගේ පරිනිර්වාණය සිදුවීම රජ දවසේ මහා ඉහළින් සිදුකරමින් ප්‍රකාශයට පත් කොට තිබෙනවා. ප්‍රදේශයේ ජනතාව ගේ ත්, පොඩි හාමුදුරුවන් වහන්සේ ගේ ත් සහයෝගය ඇතිව මිහිඳු පරිනිර්වාණ පින්කම මගේ කැපවීමෙන් සිදු කරගෙන ගියා. 2019 වර්ෂයේ දී රාජ්‍ය අනුග්‍රහය යටතේ සිදු කළ මිහිඳු පරිනිර්වාණ පින්කම රජ දවස හා සමාන ව සිදු කළ පින්කමක් බවට මට දැනෙනවා.

2020 වර්ෂයේ දී අතිගරු ජනාධිපතිතුමා අරම්භ කළ මිහිඳු මහා සෑය චෛත්‍ය මේ වන විට ඉදිකර ගෙන යනවා . ලබන වසරේ දී එම ඉදිකිරීම් කටයුතු අවසන් කර ගැනීමට අප අපේක්ෂා කරනවා. මිහිඳු ගුහාවට යන පියගැට පෙළ, ධාතු මන්දිරය, බෝධිය වටා ඉදිවන රන්වැට මළුව පිළිසකර කිරීම, විශාල ධර්ම මණ්ඩපයක්, භාවනා කිරීමට විශාල ධර්ම ශාලාවක්, ආදී විහාරාරාංගයන් සකස් වෙමින් පවතිනවා.

ඒ වගේ ම ලෝකයේ පළමු අභය භූමිය, පළමු රෝහල, මිහින්තලා මහා සෑයේ මළුව, පියගැට පෙළ, ලෝකයේ පැරණි ගහකොළ, ඖෂධ වර්ග, සතා සිවුපාවා ආදී සියල්ල ම සංරක්ෂණය වෙනවා.

පෙර පාසල්, ශිෂ්‍යත්වය, සාමාන්‍ය පෙළ, උසස් පෙළ, සරසවි දරුවන් ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් වගේ ම ගැබිනි මව්වරුන් වෙනුවෙන් බොහෝ දෙනා ගේ සහයෝගය මත සමාජ සත්කාරක සේවා සිදුකරනු ලබනවා. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ජන පවුර, තරුණ පවුර, වැඩිහිටි පවුර ආදී වශයෙන් සුභ සාධන කටයුතු සිදු කරනවා. විහාරස්ථාන ගණනාවක ආගමික, සාමාජික, ශාසනික සංවර්ධන කටයුතු සිදු කර ගෙන යන අතර, ප්‍රදේශයේ දරුවන් ගේ දහම් අධ්‍යාපනය සඳහා දහම් පාසල් පවත්වා ගෙන යනවා. තවදුරටත් සසුන් කෙත බබළවන බලාපොරොත්තුවෙන් බුද්ධ පුත්‍රයන් වහන්සේ පනස් නමක් පමණ සම්බුද්ධ ශාසනයට දායාද කිරීමට කටයුතු කර තිබෙනවා.

මිහින්තලා කඳු මුදුන, විහාරය අංග සම්පූර්ණ කරමින් අනාගත ලෝකයට දායාද කිරීමටත්, බණ භාවනා කිරීමට සුදුසු පරිදි කැලෑව සකස් කරමින්, සතා සිවුපාවා පවා ආරක්ෂා වන අකාරයට කටයුතු කිරීම ප්‍රධාන පරමාර්ථය යි.

**ජාතික ,ආගමික, ශාසනික වශයෙන් තනතුරු හොබවමින් සමාජයේ ක්‍රියාශීලී ව වැඩ සිටින ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වශයෙන් නූතනයේ පැන නැඟී ඇති බෞද්ධ ඉතිහාසය විකෘති කිරීම, ධර්මයට වැරැදි අර්ථකථන සැපයීම, ඓතිහාසික සිද්ධස්ථාන විනාශ කිරීම වැනි ක්‍රියාදාමයන් වළක්වා ගන්නට ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ යම් කෙටි පැහැදිලි කිරීමක් කරන්න නායක හාමුදුරුවනේ,**

විවිධ කණ්ඩායම්, කල්ලි එකතුවෙලා විශේෂයෙන් ත්‍රිපිටකය විකෘති කිරීම අපි දැක්කා. උගත්, වියත්, බුද්ධිමත්, බහුශ්‍රැත, වයෝ වෘද්ධ, තපෝ වෘද්ධ, ගුණ වෘද්ධ ත්‍රිපිටකය පිළිබඳ මනා දැනුමක් තිබෙන බොහොම සංවර භාවයෙන් කටයුතු කරන ඉවසීම ප්‍රගුණ කළ මහා යතිවරයාණන් වහන්සේ ගේ අවවාද අනුශාසනා ලබා ගැනීම යෝග්‍ය යි. වැරැදි අර්ථකථන සමග විශේෂයෙන් ජනතාව භෞතික ව හෝ මනංකල්පිත තැනකට වැටිල සිටිනවා. අපේ ජනතාව බුද්ධිමත් විය යුතු යි.

මේ ලෝකයේ දියුණු සමාජයක වගකීම් විරහිත ව කටයුතු කිරීම කාලෝචිත නැහැ. මිථ්‍යා දෘෂ්ටිය වෙනුවට තමයි මිහිඳු මහ රහතන් වහන්සේ අප සම්‍යක්දෘෂ්ටිකයන් බවට පත් කළේ. පූජනීය වස්තූන් මුල් කර ගෙන කටයුතු කරන ලෙස උන්වහන්සේ බුද්ධ දේශනාවත් සමඟ දේශනා කළා. එනිසා කෙනෙක් කියන පලියට නොවෙයි, කල්පනා කරල ඥුවනින් යුතු ව බුද්ධිමත් ව කටයුතු කිරීම කාලෝචිත යි. අපිට තිබෙන එකම දහම වගේ ම අපේ ගුරුවරයා ත්‍රිපිටකය යි. ඇතැම් පුද්ගලයන් බොහෝ වෙහෙර විහාරස්ථාන විනාශ කිරීම පිළිබඳ කළකිරීම් ඇති වෙනවා. ඒ සඳහා නීති රීති ගෙනැවිත් සංරක්ෂණය කිරීම කළ යුතු යි. ලෝකයේ කිසිම රටක මෙවැනි විස්මිත නිර්මාණ නැහැ. ඒවා විනාශ කිරීමෙන් වළකින්න අවශ්‍යයි. අවුරුදු දහස් ගණනක් මේවා ආරක්ෂා කළ යුතු යි. ජාතික ප්‍රතිපත්තියක් ගෙන ඒම තුළින් බෞද්ධ උරුමය නිසි පරිදි කළ මනාකරණය කර ගත හැකි යි.

හේමමාලා රන්දුනු

බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

බිනර අව අටවක 2021.09.29

## සතුට හා දුක

ගෙවෙන සැම මොහොතක ම අපි ජීවිතයේ සතුට බලාපොරොත්තු වෙමු. දුක පිළිකෙව් කරමු. ඒ සාමාන්‍ය මිනිසා ගේ හැටි ය. එහෙත් සොබාදහමේ හැටි ඊට වෙනස් ය. සතුට තාවකාලික ය. දුක ද තාවකාලික ය. වෙනස් වන්නේ ය. දුකක් නොවන්නට නම් සතුට වෙනස් නොවී තිබිය යුතු ය. එහෙත් එසේ වන්නේ නැත. දුක නැති කරන්නට නම් ඉපදීම ම නැති කළ යුතු ය. දුක නැති අමා නිවන සොයා යන ඒ ගමනේ දී අප සතුටින් ජීවත් විය යුතු ය. එය ඉබේ ලැබෙන්නේ නොවේ. උත්සාහයෙන් ලබා ගත යුතු වේ.

බෞද්ධයා ගේ හස්තසාර ග්‍රන්ථය වන ධම්මපදයේ සතුටින් ජීවත් වන මඟ අපට අපූරුවට විස්තර කොට දී තිබේ.

ඉධ මෝදති පෙච්ච මෝදති – කතපුඤ්ඤො උභයත්ථ මෝදති

සෝ මෝදති සො පමොදති – දිස්වා කම්ම විසුද්ධිමත්තනො

එයින් කියැවෙන්නේ පින් කළ පුද්ගලයා මෙලොව දී සතුටු වන බව ය. පරලොව ද සතුටු වන බව ය. තමන් ගේ පිරිසුදු කර්මය දැක සතුටු වන බව ය. වෙසෙසින් සතුටු වන බව ය. සතුට බලාපොරොත්තු වනවා නම් අප යා යුතු ඒ මඟ ය. සැබැවින් ම අප මිනිසත් බවක් ලැබ, දුර්වල නොවූ අඟපසඟ ඇතිව ජීවත් වීම ම සතුටකි. ඒ සතුට ලබන්නට අප සසර පුරා බොහෝ පින් පුරන්නට ඇත. තව දුරටත් සතුට බලාපොරොත්තු වනවා නම් අප කළ යුතු පිනෙන් පොහොසත් වීම ය. පව් අත හැරීම ය.


පස් පව් කිරීම, දස අකුසලයන් කිරීම පාපී ක්‍රියාකාරකම් ය. එම ක්‍රියාකාරකම් හි ස්වභාවය ම අපිරිසුදු බව ය. විපාක දුක් සහිත ය. ශෝකී ය. ජීවිත කාලය පුරාම පව් කළ පුද්ගලයාට සිතට නිදහසක් නැත. ඔහු නිරන්තරයෙන් ඒ ගැන පසුතැවීමට පත් වේ. බියට පත් වේ. සමාජයෙන් ද ඔහුට ගැලවීමක් නැත. පව්කාරයා යන අන්වර්ථ නාමයෙන් සමාජය විසින් ඔහු පිළිකෙව් කරනු ලබයි. මෙවැනි තත්වයක දී කවර නම් සතුටක් ද? කවර නම් සැනසීමක් ද? බුදු මඟ යන බෞද්ධයා එවැන්නකු නොවේ. හෙතෙම නිරන්තරයෙන් ම සතුටින්, සැහැල්ලුවෙන් ජීවත් වන පුද්ගලයෙකි. අනෙක් අතින් ඔහු සසර පින් කළ කෙනෙකි.

ඔහු පව පිළිකෙව් කරයි. සතුන් මැරීම, සොරකම, කාමය වරදවා හැසිරීම, බොරුව, සුරා පානය තුළ රැස් වන පාපයේ විපාකය දුක ම මිස සතුටක් ගෙන නොදෙන බව හේ දනී. ජීවිතය අප්‍රිය සහගත කරන පස් පවින් වළකින ඔහු වෙත, පසුපසින් එන සෙවණැල්ල සේ සතුට ළඟා වේ.

දානය, සීලය, භාවනාව, පින් දීම, පින් අනුමෝදන් කිරීම ආදී දස පින් කිරියවත් තුන් දෙරින් සිදු කරන උතුම් පින්කම් ය.

ඒ තුළ ලැබෙන්නේ සැහැල්ලුව හා සතුට ය. මෙලොවට පමණක් නොවේ. මතු බවයට ද ඒ සැනසීම තමන්ට හිමි වේ. බොහෝ දෙනෙක් පුරුදු ව සිටින්නේ තමන් ගේ දුකට, නොසතුටට, සැනසීමක් නැතිකමට අනුන්ට දෙස් පවරන්නට ය. එහෙත් තමන් ගේ සැනසීම තීරණය කරන්නේ තමන් මිස අනුන් නොවේ. පව් රැස් කර ගන්නේ තමන් මිස අනුන් නොවේ. ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය, පළිගැනීම ආදී සිතිවිලි සේ ම අකුසල සිතිවිලි මඟින් මෙහෙයවන ක්‍රියාකාරකම් ද තමන් පව් ගොඩකට ඇද දමයි. දහමට අනුව සිතනවා නම්, ඒ සිතිවිලි පාලනය කර ගැනීම අපහසු නොවේ. එහෙයින් තමන් තුළ ම ඇති කර ගන්නා ස්ථිර අධිෂ්ඨානයක් තුළ තමන් ගේ සැනසීම උදා කර ගන්නට උත්සාහ කළ යුතු වේ. ඒ මාර්ගය යහපත් කිසිවෙක් ප්‍රතික්ෂේප කරන්නක් නොවේ. ඒ තුළ ලැබෙන්නා වූ උදාර පලය සැනසීම, සතුට ම ය.

# අටසිල් පද



**බෞද්ධ රටවල බැතිමතුන් පුරුදුව ඇත්තේ පුන් පොහෝ දිනවල හා සෙසු පොහොය දින වැනි විශේෂ දිනවල අටසිල් සමාදන් වීමට ය. සැදැහැවත්තු උදැසනින් විහාර ආරාම වෙත පැමිණ සිල් සමාදන් වී මුළු දවස ම එහි ගත කරති. අටසිල් සමාදන් වීමෙන් ඔවුන් ගේ එදිනෙදා ජීවිතයේ ඉදිරිපත්වන භෞතික හා වින්දන ඉල්ලුම්වලින් වෙන් වී සිටිය හැකි වේ. අටසිල් සමාදන් වීමේ පරමාර්ථය නම් විවේකය, සන්සුන් බව වඩා ගනිමින්, සිත පුහුණු කරමින් තමා ගේ ආධ්‍යාත්මික වර්ධනය ලබා ගැනීම යි.**

සිල් සමාදන් වන කාලය තුළ දී බණ පොත් කියවීමෙන්, ධර්මය ශ්‍රවණය කිරීමෙන්, භාවනාවේ යෙදීමෙන් ආරාමයේ ආගමික වැඩට සහාය වෙමින් කල් ගෙවති. පසුදා උදෑසන අටසිල් මිදී පන්සිල් ගැනීමෙන් පසු ඔවුන් ගේ සාමාන්‍ය ජීවිතය ඇරඹීම වස් ගේ දෙර බලා ආපසු එති. අටසිල් සමාදන් වීමෙන් අදහස් කරන්නේ මෙවන් වැළකීම් ය. සතුන් මැරීම, සොරකම, කාමයෝ වරදවා හැසිරීම, මුසාවාදාය, මත්පැන්, හිරු අවරට හැරී මෙන් පසු ආහාර ගැනීම, නැටුම් ගැයුම් වැයුම් අයොග්‍ය දර්ශන මල්දම් සුවඳ විලවුන් ආලේප ඈ අලංකාර විචිත්‍ර දෑ පරිහරණය, උස් සුව පහසු අසුන් හි හිඳීම් ආදිය යි.

ඇතැම් අයට මේ ශික්ෂාපදවලින් ඇතැම් ශික්ෂා පදයක වැදගත්කම අවබෝධ කර ගැනීම දුෂ්කර වී ඇති බැව් පෙනේ. ඔවුන් සිතන්නේ බෞද්ධයින් නැටුම් ගැයුම්, වැයුම්, සිනමාව, සුවඳ විලවුන්, විසිතුරු ආභරණ ආදී සුව පහසු දෑ කෙරෙහි විරුද්ධ බවකි. සැම ගිහියකු ම එවැනි දෑ කෙරෙන් වෙන්විය යුතු යැයි කිසිදු නීතියක් බුදු සමයේ කො තැනක වත් සඳහන් වී නොමැත. එවන් දෙයින් වැළකීම තෝරා ගනු ලබන්නේ සැදැහැවත් බෞද්ධයන් අටසිල් සමාදන් වන කෙටි කාලයේ දී ස්වයං හික්මීමේ මාර්ගයක් ලෙස ය. එයට ප්‍රධාන හේතුව ඊනියා සංග්‍රහයන් ගෙන් විචිත්‍ර කරණයෙන් ඉවත්වීම නිසා ඉන්ද්‍රියයන් ඉතා කෙටි කාලයකට නිසංසල කිරීමටත්, ඒ අනුව සිත ඉන්ද්‍රියයනට වහල් නොවී පුහුණු කර ගැනීමටත් හැකිවීම ය. ආදාර සංග්‍රහයන් සිතෙහි අනුරතිය වඩවයි. ඒ මඟින් ඇතිවන චිත්තවේග පුද්ගලයා ගේ ආධ්‍යාත්මික සංවර්ධනයට බාධා පමුණුවයි. එවන් සංග්‍රහාදියෙන් යම් කිසි අවස්ථාවල වැළකී සිටීමට තැත් කිරීමෙන් තම දුර්වලතා ජය ගැනීමත්, තමා පාලනය කර ගැනීම පුළුල් ලෙසින් පුහුණු වීමත් නිසා ප්‍රගතියක් ඇති වේ. බෞද්ධයෝ ප්‍රීති සම්භාෂණ ප්‍රතික්ෂේප නො කරති. පන්සිල් හෝ අටසිල් සමාදන්වීම අවංක සිතින් කරන්නේ නම්, එය නිශ්චිත පුණ්‍ය ක්‍රියාවකි. එයින් මහත් වූ ප්‍රතිලාභයක් මෙ ලොව හා පරලොව සඳහා ගෙන දෙයි. එබැවින් සැම පුද්ගලයකු ම හැකි සැම අවස්ථාවක ම අවබෝධයෙන් යුතුව සිල් සමාදන්වීමට තමනට හැකි තරම් උත්සාහ ගත යුතු ය.

"ඇතැම් අයට මේ ශික්ෂාපදවලින් ඇතැම් ශික්ෂා පදයක වැදගත්කම අවබෝධ කර ගැනීම දුෂ්කර වී ඇති බැව් පෙනේ. ඔවුන් සිතන්නේ බෞද්ධයින් නැටුම් ගැයුම්, වැයුම්, සිනමාව, සුවඳ විලවුන්, විසිතුරු ආභරණ ආදී සුව පහසු දෑ කෙරෙහි විරුද්ධ බවකි."

**කේ. ශ්‍රී ධම්මානන්ද නාහිමි**

# සුවඳවත් ජීවිතය දුර්ගන්ධවත් කර ගන්නේ කුමට ද?

**ජීවිතයේ ලස්සන ම කාලය කුමක්ද කියලා ඇසුවොත්, බොහෝ දෙනකු ගේ පිළිතුර වන්නේ ඒ, තරුණ කාලය බවයි. එය බොහෝ විට නිවැරැදි පිළිතුරක්. එහෙත් තරුණ ජීවිතයක් අවාට ගියාට ලස්සන වන්නේ නෑ .ඒ සඳහා සපුරා ගත යුතු ගුණාංග තිබෙනවා. හොඳ දේ, නරක දේ තෝරා බේරා ගන්නට හැකි වීම එහිදී ප්‍රධාන යි.**

විවිධ සංස්කෘතීන් හා සිරිත් විරිත් මිශ්‍ර වීම නිසා ත් ,සිතේ පහළවන කෝපය, ඊර්ෂ්‍යාව, ලෝභය, ආශාව ආදී ආවේග පාලනයකින් තොර වීම නිසාත් තරුණ වයස බොහෝ විට වැරැදි මග යනවා.

බුදු දහමේ මේ ආවේග හඳුන්වා දී තිබෙන්නේ කෙලෙස් හැටියට යි . මේ සියල්ල ම මොහොතෙක්, මොහොතක් පාසා වෙනස් වන ලෝකයේ මම, මගේ කියා වෙනස්වීම අමතක කර කටයුතු කිරීම මෝහය යි. මෙන්න මේ මෝහය සියලු ආවේගවලට මූලික ම හේතුවයි. මේ සියලු කෙලෙස්වල වර්ධනය අපේ ජීවිතයේ දුක් පිණිස හේතු වනවා. ඒවගේ ම මේ කෙලෙස් පාලනය කරනවා නම්, නැති කරනවා නම් එය සැප පිණිස හේතු වනවා.

සිතේ ඇතිවන කෙලෙස් හඳුනාගෙන යම් පාලනයකට යටත් කළ හැකි නම්, ඒ කෙලෙස් ආවේග බවට පත් වන්නේ නෑ...

සිරකරුවන් ගැන සිතමු. ඔවුන් ගෙන් බොහෝ පිරිසක් විවිධ ආවේගකාරී ක්‍රියාවන්ට යොමු වූ අයයි. ඔවුන් ආවේගකාරී ක්‍රියාවන්ට යොමු වන්නේ එහි ඇති ආදීනව දැන හෝ නොදැන ද විය හැකියි. රාග, ද්වේෂ ආදී මනුෂ්‍යයා ගේ සිතේ පහළවන සිතිවිලිවල හට ගැනීමට හේතුව මෙන් ම, ඒවායේ ඇති අනිත්‍ය ස්වභාවය ද, ඒ සිතිවිලිවලට ගොඩනැඟීමට ඉඩදීමෙන් ඇතිවන හානිකර ස්වභාවය ද මැනවින් තේරුම් ගැනීමෙන් මේ කෙලෙස් සිතිවිලිවල ක්‍රියාකාරිත්වය අඩු කිරීමක් හා නිවීමක් ඇතිකර ගත හැකියි.

දැන් දැන් බොහෝ දෙනෙක් කතා කරන තරුණ අසහනයට ද මේ ආවේගකාරී සිතිවිලි හේතු වනවා. කිසියම් යන්ත්‍රයක් වැරැදි ආකාරයට ක්‍රියාත්මක කළේ නම්, එය ක්‍රියා විරහිත වන්නට පුළුවන්. එසේත් නැති නම් සම්පූර්ණයෙන් විනාශ වන්නට පුළුවන්. අප ගේ සිතේ හට ගන්නා වූ සිතිවිලි වැරැදි ආකාරයට හැසිරවීමෙන් සිදුවන්නේ ද මේ දෙය ම යි. ඒ කියන්නේ වැරැදි සිතිවිලිවලින් අප ගේ මනස දුර්වල වීමයි. අසහනයට, මානසික රෝග හා මානසික විකෘති ස්වභාවයන්ට ලක්වීම යි. එසේත් නැති නම් ජීවිතය සම්පූර්ණයෙන් ම කඩා වැටීමයි.

නිරෝගී බව මහා ලාභයක් බවයි ධර්මයෙහි සඳහන් වන්නේ. ලෙඩ දුක් ඇති විට ජීවිතය මොන තරම් දුෂ්කර ද යන්න වටහා ගන්නට අප ගේ අත්දැකීම් වුව ද ප්‍රමාණවත්. රෝගී බව කියන්නේ අප ගේ සිරුර ලෙඩ වීම පමණක් නොවේ. සිත ද නිරෝගී වන්නට ඕනෑ. සිත ලෙඩ වුණොත් කිසිදු කාර්යයක් නිවැරැදි ව කර ගන්නට නොහැකි යි. කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බලන්නේ මොන තරම් කලාතුරකින් ද? එය සිතා ගන්නට පවා අපහසු යි. මිනිස් ජීවිතයක් ලැබීමත් ඒ වගේ. ඉතාමත් අපහසු යි. එසේ අපහසුවෙන් ලද මේ මනුෂ්‍ය ජීවිතයෙන් ඵලයක් ලබන්නට නම්, මනසේ නීරෝගී බව ඕනෑම යි. තරුණ වියේ කායික ව මෙන් ම, මනස ද දුක් දෙම්නස්වලින් හැකිතාක් ඈත් කොට නිවැරැදි මානසික සන්තෘෂ්ඨියක් ලැබිය යුතු වනවා.

> අසංවර තාරුණ්‍ය හරියට කිඩාරම් මලක් වගේ. ඉන්න හිටින තැනත් දුර්ගන්ධවත් කරනවා. තාරුණ්‍යයේ බැල්ම පවා රාගික නොවිය යුතුයි. තරහවෙන්, වෛරයෙන් පිරී නොතිබිය යුතු යි.

කායික ශක්තිය පවතින තරුණ වයසේ දී ඉන්ද්‍රිය අසංවර නම්, තමන්ට විතරක් නොවෙයි, සමාජයේ අන් අයටත් මහත් විපතක් ගෙන දෙනවා. අසංවර තාරුණ්‍ය හරියට කිඩාරම් මලක් වගේ. ඉන්න හිටින තැනත් දුර්ගන්ධවත් කරනවා.

තාරුණ්‍යයේ බැල්ම පවා රාගික නොවිය යුතුයි. තරහවෙන්, වෛරයෙන් පිරී නොතිබිය යුතු යි.

තම මව වැනි හැඟීමකින් ඕනෑම කාන්තාවක් දෙස බලන්නට තරුණ්‍යයට හැකි විය යුතුයි. සොහොයුරන්, සොහොයුරියන් දෙස බලන අයුරින් සම වයස් කණ්ඩායම් දෙස බැලිය යුතුයි. ඇඳුම පැළඳුම, ආහාර, නිවාස, බෙහෙත් ආදී මූලික අවශ්‍යතාවයන් හි නියම තේරුම හඳුනා ගත යුතුයි.

ආහාරය අවශ්‍ය වන්නේ අප ගේ බඩගින්න නිවාගෙන ජීවිතය පවත්වා ගැනීමට නම්, ඇයි තවත් කෙනකු ගේ දේ සොරකම් කොට, ජීවිත විනාශ කොට, සිතකට ගින්දර දී අප ගේ බඩගින්න නිවා ගැනීමට කටයුතු කරන්නේ? එය අමනුෂ්‍ය ගතියක්. ඇතැම් තිරිසන් සතුන් අනුන් ගේ දේ උදුරා ගෙන නකවා. ඇයි අප ඒ තත්වයට වැටෙන්නේ.

ඉවසීම උතුම් ගුණයක්. එහෙත් ඉවසිය යුත්තේ තරහවෙන් හා වෛරයෙන් නොවේ. යම් පුද්ගලයෙක් තමන්ට කිසිවක් කර කියා ගත නොහැකි අවස්ථාවක අමනාපයෙන් හා තරහවෙන් ඉවසනවා. ඒ ඉවසීම උතුම් ඉවසීමක් වන්නේ නෑ. ඉවසීම පුරුදු කළ යුත්තේ මෛත්‍රී සිතකින් . එසේත් නැති නම් මධ්‍යස්ථ වූ සිතකින් . තරහෙන් හා වෛරී සිතින් යුතු ව, ඉවසන බව බාහිරට පෙන්නුවත් සැබැවට ම ඒ පුද්ගලයා අභ්‍යන්තරයෙන් බොහෝ පීඩා විඳින්නෙක් බවට පත් වෙනවා.

පස මිතුරන් ඇසුර ද, නොමනා ස්ථානයන් හි අවේලාවන් හි හැසිරීම ද තරුණ ජීවිතයකට පුරුදු විය යුතු යහ ගුණයන් නොවේ. සමාජයේ බොහෝ යහපත් තරුණ දරුවෝ නොමනා ඇසුර නිසා විනාශය ළඟා කර ගෙන තිබෙනවා.

සිත පෙළන පීඩාකාරී, අකුසල සිතිවිලි පාලනයට සමථ විදර්ශනාව වැනි භාවනාවකට යොමුවිය හැකියි. භාවනාවෙන් සිදු වන්නේ අකුසල් සිතිවිලි බැහැර වී කුසල් සිතිවිලි වැඩි වීමයි. සමාජයේ බොහෝ අයෙක් භාවනාව නිසා තරුණ ජීවිතය අකර්මණ්‍ය වේ යැයි සිතනවා. එය ඉතාමත් වැරැදි ආකල්පයක් . භවනාවෙන් මනා සිහිනුවණක් පිහිටනවා. මනා සිහි නුවණින් යුතු තාරුණ්‍යය හැබැවට ම ප්‍රසන්නයි. ඒ තුළ ඉගෙනීම, රැකියාව, වගේ ම පවුල් ජීවිතයත් සැබැවට ම ප්‍රසන්න ව, සුන්දර ව ගත කිරීමට ලැබෙනවා.

දීපා පෙරේරා



## පෝය ලබන සහ ගෙවෙන අයුරු

| බිනර අව අටවක | බිනර අමාවක |
|---|---|
| සැප්තැම්බර් 28 අඟහරුවාදා අපර භාග 18.16 අව අටවක ලබා 29 වන බදාදා අපර භාග 20.29 ගෙවේ. බදාදා සිල් | ඔක්තෝබර් 05 අඟහරුවාදා අපර භාග 19.04 අමාවක ලබා 06 වන බදාදා අපර භාග 16.35 ගෙවේ බදාදා සිල් |

# පින් දහම් කරන්න
# දුප්පත්කම බාධාවක් කර ගන්න එපා

**අද අප මුහුණ දෙන ආර්ථික රටාවත් එක්ක බොහෝ විට මුල්තැන ලැබෙන්නේ මුදලට. අධ්‍යාපනය වේවා, නිවසක් තැනීමේ දී වේවා, උදව්වක් උපකාරයක් ලබා ගැනීමේ දී වේවා සෑම දෙයකට ම මුදල් ඕනෑ. මේ විදිහට සෑම දෙයකට ම මුදල් අවශ්‍ය නිසා පිනක් දහමක් කරන්නත් මුදල් ඕනෑ කියා බොහෝ දෙනෙක් සිතනවා.**

ඇත්තට ම පින් දහම් කරන්න මුදල් ඕනෑ ම ද? ඒ ගැන සිතන්නට පළමුව පින් ක්‍රියා කියන්නේ මොනවාද කියලා දැන ගන්න ඕනෑ. දන්දීම, අනුන්නට උදව් උපකාර කිරීම, සිල් රැකීම, පංච සීලය ආරක්ෂා කිරීම, තෙරුවන් සරණ යෑම පින් රැස්වන ක්‍රියාවන්. එලෙස ම යම් යම් සමාජ සේවා කටයුතුවල දී ත්, මං මාවත් ඉදිකිරීම, ළිං පොකුණු, වැසිකිළි ආදිය තැනීම, ගිලනුන්ට උපස්ථාන කිරීම, මව්පියන් පෝෂණය කිරීම, අසරණයටන්ට උදව් කිරීම ආදියෙන් අප පිනෙන් පොහොසත් වනවා. මෙහිදී වඩාත් වැදගත් වන්නේ පින්කම් කිරීමේ දී කර්මය හා කර්මඵලය පිළිබඳ විශ්වාසය ඇති ව අවබෝධයෙන් කිරීම යි.

ජීවිතයේ සැප බලාපොරොත්තු වනවා නම් පින් කරන්නට ම ඕනෑ. විමාන වත්ථු කතා ඒ සඳහා අපට උදාහරණ සපයමින් පින් කරගෙන තිබෙන්නේ කවුද? ඒ කෙසේද කියා පැහැදිලි කර තිබෙනවා. එසේ සම්පූර්ණයෙන් ම පින, පිනක් වශයෙන් කරගෙන තිබෙන්නේ පිරිසුදු චේතනා තිබූ අයයි. මුදල් තිබූ පමණින්, පින් කළ පමණින් ඒ පින මහත්ඵල මානිශංස ලෙස රැස්වන්නේ නැහැ. ප්‍රාණඝාතයෙන් වැළකීම, සොරකමින් වැළකීම, වැරැදිකාම සේවනයෙන් වැළකීම, බොරුකීමෙන් වැළකීම , කේළාම් කීමෙන් වැළකීම, හිස් වචනයෙන් වැළකීම, පරුෂ වචනයෙන් වැළකීම මේ ආදී සියල්ල පින් ය. මේ පින් සපුරා ගන්නට මුදල් අවශ්‍ය වන්නේ නැහැ.

ඒ වගේ ම අන්සතු දෙයට ආශා නො කිරීමත් පිනක්. එය ඉතා දියුණු මානසික මට්ටමක්. අනුන්නට ද්වේශ නොකිරීම, මිථ්‍යා දෘෂ්ටියෙන් මිදීම සහ සම්මා දිට්ඨියෙන් යුතුවීමත් ඉතා පිනක්. මුදල් තිබෙන අය පමණක් පින් කරනවා නම් ඒ පින ධනවාදී එකක් විය යුතු යි. නමුත් පින කියන්නේ ධනවත් අයට පමණක් අයත් එකක් නොවේ. පෝදිනට උපෝසථ සීලය ආරක්ෂා කරන්නට, අනුස්සති භාවනාවක් වඩන්නට මුදල් අවශ්‍ය වන්නේ නැහැ. භාග්‍යවතුන් වහන්සේ වදාළ ලෙස මෛත්‍රී භාවනාව තුළින් බොහෝ පින් රැස් වනවා. ඒ සඳහා මුදල් ඇවැසි නොවුණත් අත්‍යවශ්‍ය කරුණු කිහිපයක් තිබෙනවා. ඒ, උත්සාහය, වීර්යය සහ උනන්දුව යි.

පින පිළිබඳ කතා කරන විට දාන, සීල, භාවනා ප්‍රධානයි. මෙහිදී සීලය රැකීමටත්, භාවනා කිරීමටත් මුදල් අවශ්‍ය වන්නේ නැහැ. ඒ සඳහා අවශ්‍ය වන්නේ තමා ගේ කැමැත්ත පමණ යි. මුදල සම්බන්ධ වන්නේ දානය සඳහා පමණ යි. එහිදීත් බොහෝවිට ආමිස දානය සඳහා පමණ යි මුදල් අවශ්‍ය වන්නේ. ප්‍රතිපත්ති වශයෙන් තෙරුවන් පුදා පින් රැස් කර ගැනීමට අපට මුදලක් වියදම් වන්නේ නැහැ.

> භාග්‍යවතුන් වහන්සේ වදාළා දානය කෙනකු ගේ අතමිට සරු කල්හි මෙන් ම, සරු නො මැති කල්හි ද දිය යුතු බව. නැති බැරි වූ පමණින් දන් නො දී සිටින්නට එපා. වැදගත් වන්නේ සුළු දෙයක් හෝ කර්මය, කර්මඵලය විශ්වාසයෙන් යුතුව දීම යි.



දිනක් භාග්‍යවතුන් වහන්සේ වදාළා යම් කෙනෙක් හෝ පිරිසක් උදේ, දවල්, රාත්‍රී බත් හැළි සියය බැගින් සකසා දෙන දානයට වඩා, ගව දෙනක ගේ තන බුරුල්ලෙන් කිරි දෙවන තරම් කාලයක් මෛත්‍රී භාවනාව කරනවා නම් එයින් මහත් වූ පිනක් රැස්වෙන බව. මෙත් සිත මහත් වූ පින් රැස්කර දෙනවා.

ඒ වගේ ම තථාගතයන් වහන්සේ වදාළා යමෙක් ප්‍රාණඝාතයෙන් වෙන් වී සිටින්නේ ද ඔහු ලොවට අභය දානය දෙන බව. අභය දානය කියන්නේ ප්‍රාණඝාතයෙන් වැළැකී සිටීමයි. එලෙස ම සොරකමින් වෙන් වී සිටින කෙනා ලෝකය බයෙන් මුදවනවා. එසේ ම වැරැදිකාම සේවනයෙන් වැළකුණු සමාජය සදාචාරය දන් දෙනවා. බොරු නො කියක පුද්ගලයා සත්‍යය දන් දෙනවා. මත්වතුර පානය නොකරන කෙනා දන් දෙන්නේ සිහි නුවණ යි. එසේ සිල්පද පහ රකින පුද්ගලයා වෙත නිරන්තරයෙන් ම පුණ්‍ය ගංගාවන් ගලා එනවා. ඒ ගංගාවන් සිඳෙන්නේ නැහැ. නිරතුරුව ම ගලා ගෙන යනවා. එලෙස යම් කාන්තාවක්, යම් පුරුෂයෙක් තෙරුවන් වෙනුවෙන් ජීවිතය පුදා, සිල්පද රැක ගන්නවා නම්, ඒ ජීවිතය පිනෙන් පිරී ඉතිරී යනවා.

භාග්‍යවතුන් වහන්සේ වදාළා දානය කෙනකු ගේ අතමිට සරු කල්හි මෙන් ම, සරු නො මැති කල්හි ද දිය යුතු බව. නැති බැරි වූ පමණින් දන් නො දී සිටින්නට එපා. වැදගත් වන්නේ සුළු දෙයක් හෝ කර්මය, කර්මඵලය විශ්වාසයෙන් යුතුව දීම යි. විමාන වත්ථු කතාවල සඳහන් වෙනවා සමහර ස්ත්‍රීන්ට දිව්‍යාංගනාවන් ලෙස දිව්‍ය විමාන පහළ වෙලා තිබෙනවා සුළු ඇඹුල් කැඳක්, රහතන් වහන්සේ නමකට පූජා කිරීමෙන්, කුඩා අඹ ගෙඩියක් පූජා කිරීමෙන්, එක් කැවුමක් පූජා කිරීමෙන්, පැන් ස්වල්පයක් පූජා කිරීමෙන් මනුස්ස ලෝකය අත හරිනවාත් සමඟ ම මහා සැප ඇති දිව්‍ය ලෝකයන් හි උපත ලබන්නට හැකි වුණා. ඒ තමාට තිබෙන සුළු දේ හෝ සිත පහදවා දීමෙනුයි.

එලෙස ම කාන්තාවකට නම් තම නිවසේ දී කිසිදු වියදමකින් තොරව ම පින් කරගත හැකියි. තමන් ගේ ස්වාමියාට මෘදු වචනයෙන් කතා කිරීමෙන්, උදේම අවදි වී නිවසේ වැඩ කටයුතු මෙත් සිතින් කිරීමෙන්, ස්වාමියාට දුෂ්කර කාලයක් ආ විට හෝ ව්‍යාපාරය කඩා වැටුණ විටෙක දී බැණ වැදීම්, අඬවැඩියාවන් නො කොට ඒ කටයුතු තේරුම් ගෙන තමන් ගේ ස්වාමියාට ශක්තියක් විය හැකි නම් ඒ කාන්තාව ස්වාමියාට සැලකුවා වෙනවා. මවක්, සොහොයුරියක්, නැඟණියක් ලෙස ස්වාමියාට සලකන, ස්වාමියාට නිති ගෞරව කරන කාන්තාව යන්නේ නිම්මානරතී දෙව්ලොව යි.

ඒ වගේ ම අම්මා තරම් කෙනෙක් මේ ලෝකයේ දරුවකුට තවත් නැහැ. ඒ නිසා අම්මාට පුළුවන් සවස් කාලයේ දරුවන් එකතු කරගෙන බුද්ධ වන්දනාව කරන්න. පිරිත් කියන්න. තමන්ට, තමන් ගේ නිවසේ අයට, ලෝ වැසියන්ට රට වැසියන්ට සෙත් පතන්න. විවේක අවස්ථාවක දී දරුවන්ට බෝසත් කතාවක්, ජාතක කතාවක්, අපේ රටේ ඉතිහාසය ගැන කියලා දෙන්න. එසේ දරුවන්ට යහමඟ කියා දෙනවා නම්, දරුවන් තිසරණයේ සමාදන් කරනවා නම්, ඇය රැස් කර ගන්නේ අප්‍රමාණ පිනක්. ඒ සඳහා විශාල ගෙවල් දොරවල් අවශ්‍ය නැහැ. වටිනා ඇඳුම් පැළඳුම් අවශ්‍ය නැහැ. තමා සිටින නිවෙස පිරිසුදුවත්, පිළිවෙළටත් තබා ගෙන බිරිඳක ගේ , අම්මා ගේ කාර්යය නිසි ලෙස තේරුම් ගෙන ක්‍රියා කරනවා නම් ඇයට මහත් වූ පිනක් රැස් කර ගත හැකි වෙනවා.

ඒ නිසා තමා දක්ෂ නම්, යෝනිසෝමනසිකාරයෙන් යුක්ත නම්, මුදල් තිබුණත් නැතත්, පිරිවර සිටියත් නැතත්, දුක් කරදර පීඩා තිබුණත් නැතත්, රෝගී වුවත් නැතත්, තමා ගේ ජීවිතයට අප්‍රමාණ පින් රැස් කර ගෙන දුක් විඳින මේ සසරින් එතෙර වීමට වාසනාව ලැබෙනවා.

නයනා නිල්මිණී

# විමලී කුමරියට වෙදකම් කිරීම මිත්‍ර සෙනෙවි පමා කරයි

**සිරිනාග උදෑසනින් ම අවදි විය. උදෑසනින් පිළියෙළ කර තිබූ ඔසුපැන් බඳුන බී දිය නා, නිල කුටියට ගොස් දවසේ වැඩ සැලසුම් කරගත්තේ ය. නිවස ඉදිරිපිට බුදු කුටියට ගොස් මල් පහන් පුදා බුදුන් වැන්දේ ය. දෙවියන්ටත්, සියලු ඥාතීන්ටත් පින් දුන්නේ ය. අවසානයේ ලොවට සෙත් පැතුවේ ය.**

දුටුගැමුණු රජතුමා ගේ ජයග්‍රහණය සඳහා දිවි හිමියෙන් කැපවන බවට බුදුරජාණන් වහන්සේ ඉදිරියේ ප්‍රතිඥා දුන්නේ ය. අනතුරුව කුටියට ගොස් ගමනට සූදානම් විය. උදෑසන ආහාරය ගෙන නිවෙසින් බැහැර ව අශ්වයා පිට නැඟී ඇතුළු නුවර දෙසට ගමන් කළේ ය.

ඇතුළු නුවර වීදිය දිගේ මද දුරක් ගිය ඔහු කලින් අසා දැන ගත් විස්තර අනුව පැමිණ සුන්දර ගෙවත්තකින් යුතු ප්‍රියමනාප නිවසක් ඉදිරියේ අසු නතර කළේ ය. මෙය පුෂ්පනාථ වෙදැදුරු ගේ නිවෙස විය යුතු යැයි හැඟිණි. නිවස ඉදිරිපිට පැළවලට සාත්තු කරමින් සිටි මහලු වියට ළං වූ පුද්ගලයෙක් අසු ගේ හඬ අසා හිස හරවා බැලුවේ ය.

සිරිනාග එහි වූ කුළුණක අසු ගැට ගැසුවේ ය. මේ පුෂ්පනාථ වෙදැදුරු විය යුතු යැයි අනුමාන කළේ ය. මදක් වේලා ඔහු දෙස බලා සිටි වෙදැදුරු "මේ සිරිනාග සෙනෙවි තුමා ද?" යි විමසී ය.

"ඔව් වෙදතුමනි, ඔබ තුමා දැක හඳුනාගන්න බොහෝ දිනක සිට වුවමනාව තිබුණා. ඒත් පැමිණී දා සිට පැවරූ රාජකාරි කටයුතු නිසා ඊට ඉඩක් ලැබුණේ නැහැ."

"යමු ඇතුළට, මම බෙහෙත් පැළෑටි කිහිපයකට සාත්තු කරමින් හිටියේ. මගේ ඊඖෂධ සඳහා අවශ්‍ය සියලුම දේ මේ වත්තේ වවා තිබෙනවා. මෙහි රඳවාගෙන බෙහෙත් කරන රෝගීන්ට වුවමනා ඖෂධ පිටතින් ගන්නේ නැහැ."

වෙදතුමනි, මට මේ දිනවල පැවරී තිබුණු රාජකාරිය ප්‍රියමනාප එකක් නොවෙයි. අනුරාධපුර රාජධානියේ සැඟවී සිටින ආගන්තුකයින් සොයා බලා වාර්තා කිරීම කළේ කැමැත්තකින් නොවෙයි."

නමුත් අනික් සෙනෙවිවරුන් මෙන් සිරිනාග සෙනෙවිතුමා කිසිවකුට හිරිහැර නොකළ බව අසන්නට ලැබුණා. එහෙත් දිඝජන්තුලා වරපුරුෂ චෝදනා යටතේ අහිංසක සිංහලයන් මරා දැමූ බවට ආරංචි වුණා."

"මම කළේ සියුම් ලෙස නිරීක්ෂණය කරන බව ඇඟවීම පමණයි. සැකකටයුතු පිරිස හෙමින් සැරේ පලා ගිහින්"

"සිරිනාග සෙනෙවිතුමනි, ඔබ ඉතාම තරුණයි. ඔබේ පෙනුමෙන් සත්පුරුෂයකු බව පෙනෙනවා. ඔබ ගේ මෑණියන් ගේ යහපත් ගුණ ඔබ ළඟත් තිබෙන බව මට හිතෙනවා"

"සුමන මහා සිටුතුමා ගේ ත්, සිටු දේවිය ගේ ත් මරණ මගේ සිත කම්පා කළ ඝාතන දෙකක්. ඒ මරණවලට වගකිවයුතු පුද්ගලයන් පිටින් මෙහි ආ බවක් පෙනෙන්නේ නැහැ."

"මා ගැන ඔබතුමා තුළ පවතින විශ්වාසයට ස්තතියි වෙදතුමනි, මගේ අම්මා ගේ මරණය දැන ගත් මොහොතේ මම විලාප තියා ඇඬුවා. දින ගණනක් කෑමක්වත් ගත්තේ නැහැ."

"ඔව්, ඒ මරණය හරිම දුකක්. ඇයට අඩු නොවන උණත්, බඩේ අමාරුවත් තිබුණා. රජ ගෙදර කෑමකින් හටගත් උණක් බවයි පෙනී ගියේ. බොහෝ අමාරු වූ පසුව ලෙඩා බැලීමට මා කැඳවාගෙන ගියා . මා දුන් බෙහෙත් කිසිවකින් ඇයට ගුණයක් ලැබුණේ නැහැ. පසුව ඇයට වමනය කරන්නට සැලැස්වූවා. වමනය පරීක්ෂා කළා. අත්තන ඇට කුඩු ඇගේ ආහාරයට මිශ්‍ර වී ඇති බව පැහැදිලි ව පෙනී ගියා. ඇයට වස ශරීරගත වී ඇති නිසා බෙහෙත් ද්‍රව්‍ය කිහිපයක් සොයා ගැනීමට මා ඉක්මණින් ගෙදර අවා.

"මගදී මිත්‍ර සෙනෙවිතුමා හමු වුණා ."

"වෙදතුමනි, මේ හදිසියේ කොහෙද යන්නේ? "

"හදිසි ලෙඩෙකුට බෙහෙතක් ගෙන එන්නට යනවා"

"කවුරුද ලෙඩා?"

"බෝධිනාග ගේ බිරිඳ – විමලී කුමරිය"

"මගේ අස්රියට නඟින්න, මා ආවේත් හදිසි ලෙඩෙකුට ප්‍රතිකාර කිරීමට ඔබතුමා කැඳවා ගෙන යන්න යි"

"කවුද?"

"ඔබ ගේ ලෙඩා දෙවනුව බලන්නම්. මේ මරණාසන්න රෝගියෙක්. ඇයට වෙදකම් කිරීම මොහොතක්වත් ප්‍රමාද කරන්න බැහැ."

"මා අස්රියට නංවා ගත්තේ බෙහෙත් රැගෙන ඒමට මගේ නිවසට යාමට යි. නමුත් ඔහු මගේ බලවත් විරෝධය මැද අස්රිය තානායමට ගෙන ආවා. "

"තානායමේ ලෙඩෙක් ඉන්නවා. ගිය ගමන් ආපසු ඔබතුමා අස්රියෙන් ම එවන්නම්. බෙහෙත මට ලියා දෙන්න. අසරුවකු යවා බෙහෙත ගෙන්වා දෙන්නම්."

"මා කැමති වුණේ ම නැහැ. නමුත් ඔහු බලෙන් ම ඔහු ගේ තානායමට ගෙන ආවා. ඇත්තටම තානායමේ ලෙඩෙක් හිටියේ නැහැ. හිස ඇම්ම යැයි කියමින් තරුණියක් බොරුවට ඔළුව පෙරවාගෙන ඇඳක දිගා වී සිටියා. මෙය මිත්‍ර ගේ කපටිකමක් බව තේරුම් ගිය හැටියේ මම ඔහුට බැණ වැදුනා. මගේ කෝපය තේරුම් ගත් ඔහු අසරුවා බෙහෙත ගෙන ළඟම එන බව පැවසුවා."

"වෙදතුමනි, මෙන්න ඔබ ලියා දුන් බෙහෙත. අපි දැන්ම යමු. මිත්‍ර සෙනෙවි මා ගෙන ගොස් බෝධිනාග ගේ නිවස ඉදිරිපිට බස්සවා ගියා. නිවසට ඇතුළුවන විටම මට ඇසුනේ බෝධිනාග ගේ විලාප හඬයි. විමලී මෙලොව අතහැර ගොස් සිටියා."

"මිත්‍ර සෙනෙවි මට ගෙනැවිත් දී තිබුණේ මා ලියා දුන් බෙහෙත නොවෙයි. මුල සිට ම ඇයට ප්‍රතිකාර කිරීමෙන් මා වැළක්වීමේ උත්සාහයක මිත්‍ර සෙනෙවි නියැළී සිටියා. අද වන තෙක් මේ රහස මම කිසිවකුටත් පැවසුවේ නැහැ."

"සිරිනාග ගේ මුහුණෙහි පෙනුම වෙනස් විය. ඔහු ගේ මුහුණ කෝපයෙන් පිරී ඇති බව පුෂ්පනාථ වෙදතුමාට පෙනී ගියේ ය. ඔහු සිරිනාග ඇමතී ය.

"සෙනෙවිතුමනි, මගේ සිතේ වේදනා ගෙන දුන් අදහස එළි කිරීමට ලැබීම මට මහත් සහනයක්. ඒත් එයින් තවත් ගැටුම් ඇති වෙනවාට මම කැමති නැහැ."

"හොඳමයි වෙදතුමනි, ඔබතුමා ගේ හමුවීම ගැන මම සතුටු වෙනවා. ඉදිරියටත් ඔබතුමා ගේ ඇසුර පතමි. මම මෙහි ආවේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඳ දවස පටන්ගන්න යි. "විජිතපුර බලකොටුවට එන ලෙස දීඝාභය මහ සෙනෙවිතුමා ගේ හදිසි පණිවිඩයක් ලැබිලා තියෙනවා. එහි යන ගමන් ඔබතුමා හමුවීමට පැමිණියේ. "

සිරිනාග වෙදතුමාට වැඳ සමුගත්තේ ය. එතැනින් නික්මුණේ වචනයට නඟන්නට බැරි තරම් වේදනාබර සිතිවිලිවලින් යුතු ව ය.

ඔහු ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඳ බෝපත්වල සිසිලසත් විඳිමින් පහන් වූ සිතින් බෝ මලුවෙන් පිටතට පැමිණියා පමණි.

"සිරිනාග, "ඒ මහා සෙන්පති මිත්‍ර ගේ කටහඬ ය. ඔහු ගේ ගැඹුරු හඬෙහි වූයේ මිතුරු බවක් නම් නොවේ.

"තොප මේ සූදානම් වෙන්නේ විජිතපුර බලකොටුවට යන්න ද?"

"ඔව්, හදිසි පණිවිඩයක් ලැබී තියෙනවා"

"කාගෙන් ද?"

"දීඝාභය මහා සෙනෙවිතුමා ගෙන්"

"කුමක් සඳහා ද?"

"දන්නේ නැහැ මහ සෙනෙවිතුමනි"

"අද දීඝාභය විජිතපුර බලකොටුවේ නැහැ"

"එසේ නම් දූතයකු මට ගෙන ආ පණිවිඩයේ තේරුම කුමක් ද?"

"දීඝාභය සෙනෙවිතුමා රාත්‍රියේ හෝ කඳවුරට පැමිණිය හැකියි. හවස් වන විට මට එහි ළඟා වෙන්නට පුළුවන්. "

"උපතිස්ස කියන්නේ ඔහු මහ රජතුමා ගේ කැඳවීමක් අනුව මහියංගනයට ගිය බව යි. පිණ්ඩපාතික තිස්ස තෙරුන් වහන්සේ මහියංගන විහාරයේ වැඩ සිටින නිසා. එහි ගොස් තිබෙන්නේ වැදගත් සාකච්ඡාවකට. සමහර විට දින කිහිපයකින් එන එකක් නැහැ ."

"එසේ නම් මගේ මේ ගමනෙන් ඇති වැඩක් නැහැ. මම දැන් ම නවතින්නම්. ඔබතුමා ගෙන් මේ බව දැන ගන්නට නො ලැබුණා නම් මා නිකරුණේ වෙහෙසට පත් වෙනවා ."

"තොප අද රාත්‍රියේ මගේ නිවසේ භෝජන සංග්‍රහයට පැමිණෙනවා ද? උපතිස්සත් පැමිණෙනවා. "

"නැහැ, මහා සෙනෙවිතුමනි, උපතිස්ස සමඟ කතාබහ කරන්නට ඇත්නම් හොඳයි. නමුත් සවස මිහින්තලයට යන්නයි අදහස් කර ගෙන සිටින්නේ"

**දුටුගැමුණු මහ රජතුමා**
**48**



අයන්ති විතාන

පිටු සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ
**කාශ්‍යප බණ්ඩාර**

# ඉංග්‍රීසි ආණ්ඩුව යටතේ නායක පදවි පත් කිරීම

## ලක්දිව සංඝරාජ පදවිය 6

වර්ෂ 1815 මාර්තු දෙවැනි දින ශ්‍රී ලංකාව මුළුමනින් ම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක් බවට පත් වූ පසු උඩරට ගිවිසුම් ප්‍රකාර ව බුද්ධාගමේ සහ දේවාගමේ පුදසිරිත් ඉදිරියට පවත්වා ගෙන ඒම සඳහා ඉංග්‍රීසි ආණ්ඩුවේ අනුග්‍රහය පිරිනමන බව සඳහන් කෙරිණි. පෙර රජවරුන් සේ ම මල්වතු අස්ගිරි මහා නායක පදවි සහ ඒ වන විට පැවති නායක පදවි පිරිනැමීම ඉංග්‍රීසි ආණ්ඩුව මඟින් සිදු කරන ලදි.





යම් කිසි තනතුරක් සඳහා පුරප්පාඩුවක් ඇති වූ විට පදවිය අපේක්ෂා කරන භික්ෂූන් වහන්සේ අදාළ පරිපාලන කොට්ඨාසයේ මහ දිසාපති කාර්යාලය වෙත අයදුම්පතක් ඉදිරිපත් කළයුතු විය. ඒ අනුව විහාරයේ සංඝයා වහන්සේ ගේ ද කැමැත්ත පරිදි ඉංග්‍රීසි ආණ්ඩුව මඟින් අදාළ පදවිය සඳහා සුදුසු හිමිනමක පත් කරන ලදී. ආණ්ඩුකාරවරයා විසින් අදාළ හිමිනම මහනුවර රජ ගෙදරට කැඳවා විජිනිපත පිරිනැමීම සිදු විය.

මල්වතු අස්ගිරි උභය මහා විහාරයේ විංශත් වර්ගික කාරක සංඝ සභාව ඉංග්‍රීසි පාලන අවධියේ දී වියදම් පඩිය ලෙසින් හඳුන්වන ලදී. මල්වතු අස්ගිරි විහාරවල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නඩත්තු කිරීමට රජයේ මුදල් වියදම් කිරීමට අකමැති වූ ඉංග්‍රීසි ආණ්ඩුව ඒ සඳහා ගම්පල කෙත, වාහලවෙල, උගුරැස්ස පිටිය හෙවත් නුවරවෙල හා තලම්පිටිය යන ඉඩම් උභය විහාරයීය කාරක සභික සංඝයා වහන්සේ ගේ නඩත්තු පිණිස වෙන් කරන ලදී. මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක වෙනුවෙන් මුළු ආදායමෙන් කොටස් හතක් ද, අනු නාහිමිවරු සහ ජ්‍යෙෂ්ඨ සභිකයන් වහන්සේ වෙනුවෙන් (උභය විහාරයේ අනුනායක දෙනම ඇතුළුව සිව් නමක් ජ්‍යෙෂ්ඨ කාරක සභික ධුර හොබවති ) වෙනුවෙන් මුළු ආදායමෙන් කොටස් පහක් ද ඉතිරි හිමිවරුන්ට කොටස් තුන බැගින් ද හිමිවෙයි. මෙම බෙදීමට අනුව මහානායක පදවිය හතේ පඩිය ලෙස ද, අනුනායක හා ජ්‍යෙෂ්ඨ කාරක සභික පදවි පහේ පඩිය ලෙස ද, කාරක සභික පදවිය තුනේ පඩිය ලෙස ද හැඳින්වුණි.

වර්ෂ 1845 දී ලංකාණ්ඩුකාරවරයා බුද්ධාගම වෙනුවෙන් රාජ්‍ය මැදිහත්වීම් ඉවත් වීමට තීරණය කොට ඇති බවත්, එකී වගකීම් විහාර දෙකේ සංඝයා වහන්සේට සහ දියවඩන නිළමේ වරයාට පැවරීමට තීරණය කර ඇති බවත් දන්වා ඇත. පෙර සිරිත් ප්‍රකාරව රාජ්‍යය සහ ආගම අතර සබඳතාව දුරස් වන බැවින් සංඝයා වහන්සේ සහ රදළවරු ඊට විරෝධය පළ කොට ඇත.

1847 වසරෙහි විහාර දෙකෙහි සහ ලංකාවේ සංඝ සමාජයෙහි පරිපාලන සංශෝධනය වෙනුවෙන් විහාර දෙක වෙනුවෙන් එක් එක් පළාත් සඳහා සංඝ සමාගම් අට බැගින් පිහිටුවා ගෙන ඇත. මෙම සමාගම්වල ප්‍රධාන හිමි නම අනුනායක ලෙස ව්‍යවහාර කොට ඇත. එම අනුනායක අට නම විංශත් වර්ගික කාරක සභාවේ අනුනායක පදවිවලට අයත් නොවේ.

එම සමාගම් අට නම්,

මහනුවර සමාගම (උඩුනුවර, යටිනුවර, තුම්පනේ, සාරසියපත්තුව, දුම්බර හේවාහැට, උඩ පළාත)

සතර කෝරළේ සුළු සමාගම (සතර කෝරළය, පාත බුලත්ගම, තුන් කෝරළය)

සත් කෝරළේ ඉහළ දෙළොස් පත්තුව සුළු සමාගම (වැඋඩ විල්ලි හත්පත්තුව, හිරියාළ පත්තුව)


සත් කෝරළේ පහළ දෙළොස් පත්තුව සුළු සමාගම (දේවමැදි හත් පත්තුව, කටුගම්පොල හත්පත්තුව),

ඌව සුළු සමාගම (ඌව වෙල්ලස්ස, වියලුව,වලපනේ, කතරගම)

මාතලේ සුළු සමාගම (මාතලේ, උඩුගම, බින්තැන්න, ලග්ගල)සපරගමුවේ සුළු සමාගම (සපරගමු කෝරළ තුන)

නුවර කලාවියේ සුළු සමාගම (නුවර කලාවිය සහ තමන්කඩුව) වශයෙන් සඳහන් කළ හැකි ය.

මෙලෙස සංඝ සමාගම් පිහිටුවූ ව ද කලක් ඇවෑමෙන් අකර්මණ්‍ය වී ඇත. 1853 අප්‍රේල් මස දළදා වහන්සේ ගේ භාරකාරත්වය ඉංග්‍රීසි ආණ්ඩුව විසින් මල්වතු අස්ගිරි මහ නාහිමිවරුන්ට සහ දියවඩන නිළමේවරයා වෙත පවරා ඇත. ඒ සමග ශාසනික පදවි පිරිනැමීමේ බලය ද එම විහාරවල සංඝ සභා වෙත පවරා දී ඇති අතර, මහානායක අනුනායක පදවි සඳහා විහාරවලින් ස්වාමින්ද්‍රයන් වහන්සේ තේරීපත් වූ පසු ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා විසින් අක්ත පත්‍රයක් පිරිනැමීම සිදු කෙරුණි. 1955 වර්ෂයේ දී වැලිවිට සරණංකර මහ නාහිමියන් මල්වතු පාර්ශ්වයේ මහා නායක පදවියට සංඝ සම්මතයෙන් පත් වූ පසු මඟුල් මඩුවේ දී රාජ්‍ය උත්සවයක් පවත්වා රාජ්‍ය නායකයා ගේ අතින් සන්නස්පත්‍ර පිරිනැමීමේ සිරිත ආරම්භ වූ අතර, එය අද දක්වා උභය මහා විහාරයීය මහා නායක අනුනායක පදවි සඳහා ක්‍රියාත්මක වෙයි. ප්‍රාදේශීය නායක පදවි ද ඒ ඒ ප්‍රාදේශීය සංඝයා වහන්සේ ගේ අවශ්‍යතා මත කාරක සභාවේ කැමැත්ත පරිදි පත් කිරීම අද දක්වා සිදු කෙරෙයි.



*මඟුල් මඩුවේ පැවති ප්‍රථම මල්වතු මහ නාහිමි සන්නස්පත්‍ර ප්‍රදානෝත්සවය - 1955 ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක අග්‍රාණ්ඩුකාරතුමා විසින් වැලිවිට සරණංකර මහ නාහිමියන් වෙත මල්වතු පාර්ශ්වයේ මහා නායක පදවිය පිළිබඳ සන්නස්පත්‍රය පිරිනැමීම*

මෙම ලිපියේ ඉතිරි කොටස බුදුසරණ බිනර අමාවක පෝද (ඔක්: 06) පත්‍රයේ පළවේ.